# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1984/28 - 2016 සැප්තැම්බර් මස 15 වැනි බ්‍රහස්පතින්දා - 2016.09.15**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

*යොමුව* : MCUDP/LA/MUT(W-14)/14/02/A

*යොමුව* : 4/3/10/2014/LRB/331

කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය යටතේ සිදුකරනු ලබන උප ව්‍යාපෘතියක් වන අලුත් මාවත ප්‍රදේශයේ ප්‍රධාන ඇලේ සිට මුහුද දක්වා උමං ජලාපවහන මාර්ගයක් ඉදිකිරීම සඳහා පහත විස්තර කර ඇති ඉඩම් කොටස් රජයට පවරාගෙන අත්කර ගැනීමට ඇති බව 1964 අංක 28 දරන ඉඩම් අත්කරගැනීමේ (සංශෝධිත) පනතේ සංශෝධිත පරිදි ඉඩම් අත්කරගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

*ඉඩමේ විස්තරය :*

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අළුත් මාවත සහ ලුණු පොකුණ ග්‍රාම නිලධාරි කොට්ඨාසයන්ට අයත් අළුත් මාවත ග්‍රාමයෙහි පිහිටි සර්වේයර් ජෙනරාල් විසින් 2016.08.18 දිනැතිව පිළියෙළ කර ඇති අංක කො 9653 දරන මූලික පිඹුරේ කැබලි අංක 31, 32, 34 සහ 35 වශයෙන් දක්වා ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.1746 වන පහත විස්තර කර ඇති ඉඩම් කැබලි.

1. **කැබලි අංක 31**

ඉඩමේ නම: වරිපනම් අංකය සොයාගත නොහැක; වර්තමාන ඉඩම් පරිහරණය: ගෙවත්ත; හිමිකම් කියන අය: සොයාගත නොහැක; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0557.

2. **කැබලි අංක 32**

ඉඩමේ නම: ඩිලාසාල් වීදිය, වරිපනම් අංක 57/1; වර්තමාන ඉඩම් පරිහරණය: ගෙවත්ත; හිමිකම් කියන අය: බී. එම්. ජයතිස්ස බස්නායක, අංක 57/1, ඩිලාසාල් වීදිය, කොළඹ 15; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0395.

3. **කැබලි අංක 34**

ඉඩමේ නම: ඩිලාසාල් වීදිය, වරිපනම් අංක 30; වර්තමාන ඉඩම් පරිහරණය: පල්ලිය; හිමිකම් කියන අය: ඩෙන්සිල් පෙරේරා පියතුමා, අංක 30, ඩිලාසාල් වීදිය, කොළඹ 15; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0336.

4. **කැබලි අංක 35**

ඉඩමේ නම: —; වර්තමාන ඉඩම් පරිහරණය: මුහුද; හිමිකම් කියන අය: වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0458.

ඉහත සඳහන් ඉඩමට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලය පැවරූ අයවලුන් 2016 ඔක්තෝබර් මස 25 වැනි දින පෙ. ව. 9.30ට රාජගිරිය, වැලිකඩ, ශ්‍රී ජයවර්ධනපුර මාවතේ, අංක 03 දරන ස්ථානයේ ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවේ පිහිටා ඇති කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතියේ ඉඩම් අත්කරගැනීමේ කාර්යාලයේ දී මා හමුවිය යුතු ය.

තව ද, 2016 ඔක්තෝබර් මස 18 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන් එකී ඉඩම් අත්කර ගැනීම සඳහා වන්දි මුදල් ඉල්ලා සිටීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් ඒ සඳහා ඉල්ලා සිටින වන්දි මුදල හා එය ගණනය කළ ආකාරයත් පිටපත් දෙකක් සහිත ලියවිල්ලක් මා වෙත ඉදිරිපත් කළ යුතු ය.

සී. ඩබ්. අබේසූරිය,
ඉඩම් අත්කරගැනීමේ නිලධාරි.

2016 සැප්තැම්බර් මස 13 වැනි දින,
කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය.


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1A - G 24219 - 22 - (2016/09)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.